# පුරාණ පබළු විශ්ලේෂණය තුළින් හෙළිවන මාගම නගරයේ සංස්කෘතික නිරූපණයන්

## A Cultural reflection of Magama city reveled by ancient bead analysis

**M.P. Hansamali**

**Abstract**

Beads can be considered a very important archaeological evidence in the study of the story of early man. Beads are reported from many archaeological sites in today's contemporary world. But the functional purpose of the beads used by ancient man cannot be determined. The ancient town of Magama in the southern province is one of the most important places where ancient beads are found in Sri Lanka. This research was conducted by analyzing 151 beads from the series of archaeological excavations carried out by Prof. Raj Somadeva at eight locations (Kirindagoda, Kirinda Fort, Allegala, Tabarawa, Polbidinawala, Valagampattu, and Adalla) belonging to the Lower Kiridioya Basin. The aim of this research was to identify the beads and analyze the beads using the same sample of beads. The research problem was: What cultural characteristics of the ancient Magama city can be revealed by the analysis of bead samples? The research methodology was to study the sample of beads under variations of form, material and size and use literature sources to confirm the information. The study of Magama ancient beads identified characteristics of foreign relations, uniqueness of raw material use, technical ability, ritual, political stability, and decline and urbanization.

**Key Words:** Beads, Culture, Magama, Material, Shape

## හැඳින්වීම

මානව අතීතයේ විවිධ කාල පරිච්ඡේද පිළිබඳව අධ්‍යයනය කළ හැකි ද්‍රව්‍යාත්මක සාධක අතර සිදුරු කර අමුණා පැළඳිය හැකි හෝ යමකට සම්බන්ධ කළ හැකි අලංකරණ අංගයක් ලෙස "පබළු" සරළව හඳුන්වාදිය හැකි වුව ද අතීත සමාජවල ඊට වඩා වැඩි වටිනාකමක් පබළුවලට හිමිව පැවැති බව පුරාවිද්‍යාත්මක අධ්‍යයන තුළින් හෙළි වේ. මෙහි නිර්මාණකරණයේ ඇරඹුම ශිලායුගය දක්වා ම දිව යන්නක් බව හඳුනා ගත හැකි ය. වර්තමානයේ පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර තුළින් ද්‍රව්‍යාත්මක ශේෂයන් ලෙස හමුවන මේවායේ නිර්මිත හැඩයන් ගත් විට බොහොමයකට පැරණි මිනිසා පරිසරයේ තමන් අත් දුටු දෑ ආදේශ කොට ගෙන මල් , ගෙඩි , ඉර , හඳ , තරු මෙන් ම ජ්‍යාමිතික හැඩතල ද උපයුක්ත කොට ගනිමින් තම අවශ්‍යතාවයන් උදෙසා යම් අංගයක් නිර්මාණය කර ගෙන ඇති බව සිතිය හැකි ය. මූලික තේමාව අලංකරණය කිරීම හෝ අලංකරණය වීම වුව ද ඇතැම් විට ලෙඩ රෝගවලින් ආරක්ෂා වීම, සමාජයේ ඉහළ පාංතිකයින් තම සමාජ තත්ත්වය හුවා දැක්වීමට ද ආදී තවත් බොහෝ හේතු කාරණාවන් සඳහා උපයෝගී කොට ගෙන තිබේ.

මෙකී අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා ඔවුන් විසින් නිර්මාණය කර ගන්නා ලද පබළු පාෂාණ, අස්ථි, අං, සත්තව බිත්තර කටු, රන්, රිදී, මැටි, අගේට් හා වීදුරු වැනි බොහෝ විවිධාකාර වූ අමුද්‍රව්‍යයන් යොදා ගෙන නිර්මාණය කර තිබේ. තව ද ඇතැම් අමුද්‍රව්‍යයන් වෙනත් රටවලින් ආනයනය කොට තමන්ට රිසි ආකාරයට පබළු නිර්මාණය කර ගන්නට තරම් ඔවුන් මැදිහත් වී තිබීම තුළ ඔවුන්ගේ ජීවිතයේ ඊට වැදගත්කමක් හිමිව තිබූ බවට සාධක මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙන් ලැබේ. උදාහරණ ලෙස රන් ඇන්ටෝලියා හා ඉරාන ප්‍රදේශවලින් ද අගේට් ඉන්දියාව හා ඇෆ්ගනිස්ථානය ප්‍රදේශවලින් ද ලැපිස් ලසුලි ඇෆ්ගනිස්ථානය ප්‍රදේශවලින් ද ආනයනය කොට නිර්මාණයන් සිදු කොට තිබේ (Dubin,1987,37). තව ද නිර්මාණකරණයේ දී භාවිත තාක්ෂණය ගත් විට ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට නිර්මාණය කරන්නට යෙදුණු මේවා කෙන්දකට සම්බන්ධ කර අමුණා පැළඳීම සඳහා යොදා ගැනීමට හැකි ආකාරයේ සිදුරක් නිර්මාණය කර ගෙන සකස් කොට ගෙන ඇති

අතර තව ද කාලයත් සමඟ තාක්ෂණික වශයෙන් ඇති වු වෙනස්කම් හා අමුද්‍රව්‍යයේ ස්වභාවය අනුව වෙනස්වීම්වලට ද ලක් වී තිබේ.

අතීතයේ විවිධ වකවාණුවල නිර්මාණය කරන ලද මානව කෘති අතර පබළු ද හමුවීමෙන් මානව අතීතය අධ්‍යයනය තුළ ක්‍රමික ගොඩනැංවීමක දී දායකත්වයක් මේවා තුළින් ද ලබා ගත හැකි ය. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ඓතිහාසික යුගය දක්වා ම මේවා භාවිත කළ බවට බොහෝ පුරාවිද්‍යාත්මක සන්දර්භ තුළින් සාධක ලැබී තිබේ. එමෙන් ම පබළු සම්බන්ධව ඓතිහාසික මූලාශ්‍රයන්හි විවිධ ඓතිහාසික සිද්ධීන් විස්තර කරනු ලබන අවස්ථාවලදී සඳහන් කර තිබේ. මහාවංසයෙහි භාතිකාභයතිස්ස රජ දවස මහාථූපය පබළු දැලක් කරවා අලංකෘත කළ බව සඳහන් වන්නේ මෙසේ ය. "පබළු දැලක් කරවා ඒ සැයෙහි බහා..." (අමරවංස හිමි,1994,147). තව ද ථූපවසංයෙහි මහාථූපය බඳනා විස්තර කිරීමේ දී පබළු ලද ආකාරය මෙලෙස දක්වා ඇත. "අනුරාධපුරයට බටහිර දිශාවෙහි විසි ගවුවකින් මත්තෙහි උරුවෙල් නම් පටුණු ගම මහත් ඇඹුලපක් සා මුතු හා පබළු හා ගැල් සැටක් පුරාලන පමණ..." ප්‍රමාණයක් ලැබීමෙන් අනතුරුව රජතුමාට එයින් පාත්‍රයක් පුරවා ගෙනවිත් දුන් බව සඳහන් වේ (සරණංකර හිමි,2004,192). එමෙන් ම බුත්සරණෙහි ලෝක ස්වභාවය විස්තරය දැක්වීමේ දී "එ මැ මහමෙර පශ්චිමදිශාව පබළුමය යැ. එහෙයින් ඒ දිගු මුහුදැ දිය පබළුයෙහි පැසේ රතැ..." (සෝරත හිමි,1959,43).

ඓතිහාසික යුගය තුළ ශ්‍රී ලංකාවේ වැදගත් රාජධානියක් ලෙස රෝහණය ඉතිහාසගතව තිබේ. මෙම රෝහණය කාලයේ ඇවෑමෙන් මෙරට දේශපාලනික, ආර්ථික, සමාජීය හා සංස්කෘතික ඉතිහාසය කැපී පෙනෙන ලක්ෂණ කැටි කොට ගෙන මෙරට ඉතිහාසය සකස්වීමට ප්‍රධාන ලෙස තුඩුදුන් රාජ්‍ය මධ්‍යස්ථානයක් වූ අතර මෙය ප්‍රථමයෙන් බිහි වූයේ වර්තමාන තිස්සමහාරාමය ආශ්‍රිතව මාගම ප්‍රදේශයේ බව මේ සම්බන්ධව අදහස් දක්වන බොහෝ උගතුන්ගේ මතය වී තිබේ.

ඒ අනුව අඳුරු යුගයක දී මාගම රජ පරපුරෙන් ඇති වූ සේවාව ලංකා ඉතිහාසයේ අමරණීය වන අතර මෙරට කලින් කලට බලයට පත් වූ ප්‍රාදේශීය රාජවංශයන් සියල්ල ම අතර ඉතා වැදගත්

වන රට දැය වෙනුවෙන් ඉමහත් සේවාවක් ඉටුකළ රාජවංශයක් ලෙස මාගම රජ පෙළපත හැඳින්විය හැකි ය. ඒ අනුව පුරාණ මාගම නගරය මුල් කොටගෙන සිදු කර තිබෙන පුරාවිද්‍යාත්මක පර්යේෂණ හා එකී පර්යේෂණ තුළින් හමු වූ පබළු සම්බන්ධව සිදුකර ඇති පර්යේෂණ ගණනාවක් වේ.

හෙන්රි පාකර් (1884) විසින් "තිස්සමහාරාමයේ පුරාවිද්‍යාත්මක" සොයා ගැනීම් පිළිබඳව අධ්‍යයනයක් සිදුකර ඇත. එහි රෝහණ රාජධානියට අයත් මාගම නගරයේ පැවති නෂ්ටාවශේෂ සඳහන් කිරීමේ දී පාකර්ට ගවේෂණයේ දී හමු වූ සාධක අතර පබළු සම්බන්ධව ද සඳහන් කර තිබේ. පාකර් විස්තර කරන ආකාරය අනුව පබළු පෞද්ගලික ආභරණයක් ලෙස හඳුන්වා තිබේ (පාකර්,1884,62). තව ද කර්මාන්ත පිළිබඳව සඳහන් විස්තරයේ විවිධාකාරයෙන් හමු වූ ද්‍රව්‍යවල දී පබළු පිළිබඳව දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කරන අතර තෝරමල්ලි, කාර්නේලියන්, මැණික් ,අඹතෙස්ත, රළු තිරිවාන ,වීදුරු ආදී අමුද්‍රව්‍යන්ගෙන් නිර්මාණය කරන ලද මධ්‍යයේ සිදුරක් සහිත සම්පූර්ණ පබළු මෙන් ම කැඩීගිය පබළු හමු වී තිබෙන බව වාර්තා වේ (පාකර්,1884,61). තව ද වීදුරු පබළු ලංකාවේ නිෂ්පාදනය කරන්නට නොමැති බවත් ඒවා වෙළදාම් කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස ඇසිරියාව හරහා පිනිසියාවේ සිට ගෙන එන ලද බව දක්වේ. තව ද පබළු සෑදීමට යොදා ගත් ගල් දකුණු වෙරළින් ලබා ගන්නට ඇති බවත් කැණීම් හා ගවේෂණවලින් ලැබුණු පබළු විශාල වශයෙන් පාකර් අත්හැර දමන ලද බව සඳහන් කර තිබේ (පාකර්,1884,63).

තව ද 1992 වර්ෂයේ දී ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව හා ජර්මන් පුරාවිද්‍යා ආයතන එක් වී පුරාණ රෝහණය සම්බන්ධව ආරම්භ කරන ලද කැණීම් කටයුතු (1992,1993) (1995,1996) හා (1998,1999) වර්ෂවල දී ස්ථාන තුනක් තුළ සිදු විය. මේ සම්බන්ධ වාර්තාව 2001 දී Ancient Ruhuna නම් ග්‍රන්ථය තුළින් පළ කර ඇත. රෝහණය මුල් කරගෙන සිදු වූ දැවැන්ත කැණීම් අදියර කීපයක් මෙහි දී සිදු වූ අතර එහි දී අකුරුගොඩ වූ ගල් ටැඹක් සහිත පෞරාණික ස්ථානය, පළමු කැනීම් ස්ථානය වශයෙන් ඔසී 1ලෙස ද අධිකරණ ගොඩනැගිල්ල පිහිටි භූමියේ කැණීම් ස්ථානය, ඔසී 2 ලෙස ද අගල් සහිත විවෘත භූමි ප්‍රදේශය, ඔසී 3 ලෙස ද නම් කොට ගෙන කොටු

ක්‍රමය හා අඟල් ක්‍රමය මත පදනම්ව කැණීම් කටයුතු සිදුකර තිබේ (Weisshaar H.J Roth, Wijeypala W, 2001,15). මෙහි දී හමු වු පබළු සම්බන්ධව වර්ගීකරණය 'බඞී සඉහකකැ ්බබසඖ්ක ෘැ්බසහ්ඵ්ක් විසින් සිදුකර ඇති අතර එහි දී Tissass 1 හා Tissa 2 ස්ථානවලින් හමු වූ පබළු පමණක් වර්ගීකරණයට ලක්කර තිබේ.

මෙහි දී 1992 -1996 දක්වා කරන ලද කැණීම් තුළින් හමු වී ඇති මුළු පබළු ප්‍රමාණය 4813 ක් වන අතර ඉන් 679 ක් අධිකරණ සංකීර්ණය පිහිටි ඉඩමෙන් හමු වී තිබේ. ප්‍රධාන අමුද්‍රව්‍ය බවට පත්ව ඇත්තේ වීදුරු, ගල්, මැටි වන අතර ඒ අතරින් 9% වීදුරුවලින් නිර්මිත පබළු වේ. එමෙන් ම මෙම වීදුරු, පබළු ඒක වර්ණ හා ඒවා මෙන් ම බහුවර්ණ ඒවා ද හමු වී තිබේ. එමෙන් ම මෙම වීදුරු පබළු නිෂ්පාදනය කරන ලද තාක්ෂණය පුළුල්ව විස්තර කොට ඇති අතර එම නිෂ්පාදන ක්‍රමවේදය තුළ ඒවාට වර්ණවත්භාවය ලැබුණු ආකාරය සවිස්තරාත්මකව දක්වා තිබේ. කාබනික අමුද්‍රව්‍ය මෙන් ම අකාබනික අමුද්‍රව්‍ය මඟින් නිෂ්පාදිත පබළු පිළිබඳ දීර්ඝව දක්වා අනතුරුව සම්මතයක් ලෙස ගෙන වර්ගීකරණයට යොමු කර තිබේ.

මෙම වර්ගීකරණයට පබළුවේ හැඩය පදනම් කොටගෙන කාණ්ඩ 13 වර්ග කොට ඇති අතර ඒවායේ හැඩය ගෙන ඊට නාමය ලබා දීමට කටයුතු කර තිබේ. තව ද මෙම පර්යේෂණ ග්‍රන්ථයේ පබළුවල විද්‍යාත්මක විශ්ලේෂණයන් නිර්මිත අමුද්‍රව්‍ය පදනම් සිදුකොට ඇති අතර එය U.Schussler, C. Rosch ,R. Rock විසින් සිදු කර ඇත. ප්‍රධාන ලෙස වීදුරු පබළු විද්‍යාත්මකව විශ්ලේෂණයට ලක්කර ඇත. ඒ අනුව රෝහණය සම්බන්ධව ලැබුණු පබළු නව වර්ගීකරණයකට ලක්කර Hannible Deraniyagala යොමු කර තිබීම මෙම පර්යේෂණය තුළ හඳුනා ගත හැකි සුවිශේෂීතාවයකි (Weisshaar H.J Roth H Wijeypala W, 2001,206-224).

මෙරට පුරාවිද්‍යාත්මක පර්යේෂණ තුළ පබළු සම්බන්ධව සිදුකරන ලද අධ්‍යයනයන් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී 1970 වර්ෂයේ ජුලි 23 සිට අගෝස්තු 9 වැනි දා දක්වා ඔබසඩැරිසඑහ එම්ැමප "University of Pennsylavania" හා ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එක්ව පොම්පරිප්පු පූර්ව ඓතිහාසික යුගය

නියෝජනය කරනු ලබන මෙම ස්ථානයේ කැණීම් කටයුතු සිදු කරන ලදී. එහි එක් එක් ස්තර තුළින් පබළු හමු වී ඇති අතර ඒවා Begly විසින් වර්ගීකරණයට ලක්කොට තිබේ. මෙම කැණීම මඟින් සම්පූර්ණ පබළු 161 ක් පමණ ලැබී ඇති අතර එමෙන් ම මතුපිට ස්ථරය තුළ පෞද්ගලික ආභරණ ලෙස භාවිත කරන ලද කැටයම් කරන ලද ආභරණ අංග ද හමු වී තිබේ (Begley Vimala, 1981,53 -96).

මාන්තායි වරාය ආශ්‍රිතව 1980 වර්ෂයේ The Oriental Institute – The University of Chicgo Peabody Museum – Harvad University හා ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එක්ව සහයෝගිතා කැණීමක් සිදු කර තිබේ. මේ ස්ථානයේ කරන ලද කැණීමෙන් හමු වූ පබළු Martha Prickett වර්ගීකරණය කොට ඇති අතර එහි දී පබළු වර්ග කොට ඇත්තේ ඒවා නිර්මිත අමුද්‍රව්‍ය පදනම් කොටගෙන ය. එමෙන් ම මෙහි දී කැණීම අගල් කැණීමක් ලෙස A, B, C වශයෙන් බෙදා සිදු කොට ඇති අතර එම අගල් තුනේ ම මතුපිට හා පාදස්තරයෙන් පබළු හමු වී තිබේ. වීදුරු, ආලේප, ගල්, හෝ හඳුනා නොගත් අමුද්‍රව්‍ය හා බෙලි කටු ආදියෙන් මේවා නිර්මාණය කොට ඇති අතර වැඩි ප්‍රමාණයක් වීදුරු පබළු වන අතර සංඛ්‍යාත්මකව 39කි. හඳුනා නොගත් ප්ලාස්ටික් වැනි අමුද්‍රව්‍යයකින් එක් පබළුවක් හමු වී තිබේ. (Carswell John , Prickett Martha, 1984,3- 65).

1994 මාර්තු 23 වන දින අනුරාධපුර ඇතුළු නුවර දකුණුදිග කොටසේ කැණීම් කටයුතු ආරම්භ කරන ලද අතර එහි දී ලැබුණු පුරාවිද්‍යාත්මක අවශේෂ අතර හමු වූ මුළු පබළු සංඛ්‍යාව 245කි. ඒ අතරින් පබළු 33ක් පමණ පළවෙනි සන්දර්භයෙන් ද 27 ක් ද තුන්වැනි සන්දර්භයෙන් ද ආදි වශයෙන් 130ක් පමණ ද මතුපිට කොටසේ තිබී හඳුනා ගෙන තිබේ. මෙම පබළු වර්ගීකරණය කිරීම කර ඇත්තේ ඉතා විශාල, මධ්‍ය ප්‍රමාණය, දිග, විෂ්කම්භය යන ආකෘතියේ පවතින ලක්ෂණ පදනම් කොට ගෙන ය. මේවායේ පබළු නිෂ්පාදනය කර ඇති ආකාරය අනුව ගති ලක්ෂණ හඳුනාගත හැකි අතර ඉන් විවිධ හැඩතල හා විවිධ ප්‍රමාණයෙන් යුක්ත පමණ විශාල සංඛ්‍යාවක් හඳුනාගෙන තිබේ. මෙහි මේවා වර්ගීකරණය කිරීමේ දී හැඩතල 9කට අදාළව වර්ග කොට තිබේ (Anon, 1994 -1995,53-58).

ඉබ්බන්කටුව පූර්ව ඓතිහාසික යුගය නියෝජනය කරනු ලබන සුසාන භූමිය ආශ්‍රිතව සිදුකරන ලද කැණීමෙන් වාර්තා වී ඇති පබළු විවිධ අමුද්‍රව්‍යයන්ගෙන් යුක්ත ය. ඒ අතරින් කානේලියන් වැනි විදේශ අමුද්‍රව්‍යවලින් සකස් කරන ලද ඒවා මෙන් ම අගස්ති වර්ගය ද ඒ හැරුණු විට ටෙරකොටා හා ශිලා පබළු විශාල වශයෙන් ලැබී ඇති අතර ඒවා ක්‍රමානුකූලව වර්ගීකරණයකට භාජනය කොට නොමැත (Bandaranayake Senaka, 1994,105 -110).

එමෙන් ම මෙම ලිපියේ සඳහන් පර්යේෂණය සඳහා පාදක වූ පූර්ව පර්යේෂණය වූයේ "දකුණු ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රභවය සම්බන්ධව" මහාචාර්ය රාජ් සෝමදේව මහතා සිදුකරන ලද පර්යේෂණය හා එම පර්යේෂණයට අදාළව හමු වූ පබළු නියැදියයි. එම පර්යේෂණයට ප්‍රධාන අරමුණ වී ඇත්තේ ලංකාවේ දකුණු කලාපය මුල් කරගෙන නාගරික සංස්කෘතිය අධ්‍යයනය කිරීම ය. එහි දී පහළ කිරිඳිඔය (Lower Kiridioya Basin) මුල් කොටගෙන නාගරික සංස්කෘතිය අධ්‍යයනය කිරීම සිදු වී අතර එහි දී එම කලාපයට අයත් පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් 300 Km 2 ඇතුළත පිහිටි ක්ෂේත්‍ර 127 ක් පමණ වාර්තා කර තිබීම වැදගත් කරුණකි. එහි පර්යේෂණ ක්ෂේත්‍රය වූ පහළ කිරිඳිඔය නිම්නය තුළ කිරින්දගොඩාන, කිරින්ද වරාය, ඇල්ලේගල, තඹරාව, පොල්බිඳින්වල, වලගම්පත්තුව හා අදල්ල යන ස්ථානවල කැණීම් කරන ලද ක්ෂේත්‍ර 8ක් පිළිබඳව ක්‍රමවත් තොරතුරු අන්තර්ගතවන අතර අනතුරුව සමස්ත පර්යේෂණයෙන් හමු වූ ද්‍රව්‍යාත්මක සාධක වර්ගීකරණයට හා විශ්ලේෂණයන්ට යොමු වී ඇත. තව ද මෙහි හමු වූ ද්‍රව්‍ය අතර මැටිවලින් කරන ලද විවිධ නිර්මාණ, ලෝහ පුරා කෘති, ආයුධ හා මෙවලම් කෘෂිකාර්මික උපකරණ, රූපලාවන්‍ය උපකරණ, කාසි ,බිලි කොකු, වීදුරු, අස්ථි මෙවලම්, පබළු, වළං, ශාක අවශේෂ ආදිය සම්බන්ධව පුළුල් ලෙස අධ්‍යයනය කර තිබේ. එමෙන් ම පහළ කිරිඳිඔය නිම්නය ආශ්‍රිතව කැණීම් කරන ලද ක්ෂේත්‍ර 8න් විවිධාකාරයේ අමුද්‍රව්‍ය හා හැඩතවලින් සමන්විත පබළු කැණීම් තුළින් හමු වී තිබෙන බව ග්‍රන්ථයේ දැක්වේ (Somdeva Raj, 2006,194 -201 ).

යථෝක්ත සඳහන් කරන ලද සාහිත්‍ය විමර්ශනයන් තුළ පුරාණ පබළු සම්බන්ධව ඒවායේ විවිධාකාර හැඩයන් හා අමුද්‍රව්‍ය

සම්බන්ධව වර්ගීකරණයන් හා අධ්‍යයනයන් සිදුකර තිබූ නමුත් පබළු තුළින් නිරූපණය වන සංස්කෘතික රටාව පිළිබඳව එතරම් අවධානයක් යොමු වී නොමැති නිසාවෙන් එකී කාරණ මෙම පර්යේෂණයේ, පර්යේෂණ ගැටලුව සැකසීමට පාදක විය.

**පර්යේෂණ ගැටලුව**

පබළු නියැදිය විශ්ලේෂණයෙන් අනාවරණය කර ගතහැකි මාගම නගරයේ සංස්කෘතිය කෙබඳු ද?

**පර්යේෂණයේ පරමාර්ථය හා අරමුණු**

මෙම පර්යේෂණයේ පරමාර්ථය වන්නේ පුරාණ මාගම සංස්කෘතික වර්ධනය ඇගයීමට ලක් කිරීම වන අතර එහි ලා අරමුණු වන්නේ මාගම සංස්කෘතික වර්ධනය ගොඩනැගීමට ඉවහල්වන මානව කෘති අතර පබළු හඳුනාගැනීම හා පබළු විශ්ලේෂණය කිරීම මඟින් ඒ ඔස්සේ මාගම සංස්කෘතික ඉතිහාසය පෝෂණයට දක්වන පිටිවහල අධ්‍යයනය කිරීම ය.

**ක්‍රමවේදය**

පුරාණ මාගම නගරයට අයත් පහළ කිරිඳිඔය නිම්නය ආශ්‍රිතව කිරින්දගොඩාන, කිරින්ද වරාය, ඇල්ලේගල, තඹරාව, පොල්බිඳීන්වල, වළගම්පත්තුව, අදල්ල සහ කෝන්වලාන යන ස්ථාන 8හි සිදුකළ පුරාවිද්‍යාත්මක කැණීම් මාලාවෙන් ලද පබළු සමස්තය 151ක් වන අතර ඒවා එකිනෙක ගෙන කාලයත් සමඟ පබළුවේ, ආකෘතිය අමුද්‍රව්‍ය හා ප්‍රමාණය වෙන වෙන ම අධ්‍යයනය කරන ලදී.

**ආකෘතිය**

පබළු නියැදියේ ආකෘතිය අධ්‍යයනය කිරීමේ දී කාරණා කිහිපයක් පිළිබඳ අවධානය යොමු කිරීම සිදු වූ අතර එහි දී ආකෘතිය තුළ හඳුනාගත හැකි හැඩතලහි ගුණාංග, මුහුණතේ ගුණාංග හා සෞන්දර්යාත්මක ගුණාංග ඒ අතර වෙයි. මෙහි දී හැඩතලවල ගුණාංග සම්බන්ධව අධ්‍යයනය කිරීමේ දී යොදා ගන්නා ලද්දේ Beck, Horace, C (1928) Classification & Nomenclature Of

Beads & Pandents , London: Johon Johnson For The Society Of Antiquaries ග්‍රන්ථයේ පබළුවල හැඩතල හඳුනා ගැනීමට යොදා ගන්නා ක්‍රමවේදය වේ. එමෙන් ම මුහුණතෙහි වන ගුණාංග හඳුනාගැනීමේ දී පබළුවල මුහුණතෙහි වන සලකුනු හා රේඛා ආදිය නිරීක්ෂණය කොට ඒවායේ භාවිතයේ ස්වභාවය පිළිබඳව අධ්‍යයනය කළ අතර සෞන්දර්යාත්මක ගුණාංග සම්බන්ධව අධ්‍යයනයේ දී පබළුවල හඳුනා ගත හැකි මෝස්තර සම්බන්ධව අධ්‍යයනයේ දී Horace C Beck ගේ වර්ගීකරණයේ එන VI කොටසට අදාල මෝස්තර නිරීක්ෂණය හා විමර්ශනයන් යොදා ගන්නා ලදී.

අමුද්‍රව්‍ය

පබළු නියැදිය තුළ අන්තර්ගත අමුද්‍රව්‍ය අතර මැටි, පාෂාණ, දත්, ඇටකටු, වීදුරු, ලෝහ හා දැව පවතී. මෙලෙස පබළුවල අමුද්‍රව්‍යයන් කෙරෙහි මූලික අවධානය යොමු කිරීමට හේතු වූයේ පබළු නියැදිය විශ්ලේෂණය කිරීමේ දී එය බලපාන බැවිනි. මේ නිසාවෙන් ඉහත කාණ්ඩවලට අදාළව අමුද්‍රව්‍ය බණ්ඩනය කර ගන්නා ලද්දේ සී.ජේ තොම්සන් විසින් ඉදිරිපත් කරන ලද යුගත්‍ර සංකල්පයට අනුව ය. යුගත්‍ර සංකල්පයේ දී (සෝමදේව,2017,7) විවිධ මෙවලම් අමුද්‍රව්‍ය මත පදනම්ව කාලානුක්‍රමිකව යොදාගෙන අධ්‍යයනය කළාක් මෙන් මෙහි දී පබළු නියැදිය ද මෙම කාලානුක්‍රමිකතාව මත පදනම්ව ආදි මිනිසා විසින් නිර්මාණය කරන ලද පබළුන් හි මුල් ම අමුද්‍රව්‍ය මැටි ලෙස උපකල්පනය කොට එතැන් සිට අමුද්‍රව්‍ය එකිනෙකහි වෙනස්කම්වලට අනුව අමුද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය පෙළගස්වා ගන්නා ලදී. ඒ අනුව සමස්ත පබළු නියැදිය යටතට ගැනෙන පබළුවල අමු ද්‍රව්‍ය මොනවා ද? යන්න පළමුව හඳුනාගෙන විශ්ලේෂණයන් සිදුකරන ලදී.

ප්‍රමාණය

පබළු නියැදියේ සෑම පබළුවක් ම පියවර හතරක් යටතේ ඒවා එකිනෙක ප්‍රමාණයන් ගණනය කරන ලදී. එලෙස ගණනය කිරීමට හේතු වූයේ මානව අතීතයේ ඉතා සියුම් කාරණා පවා මේවා තුල අන්තර්ගත වන නිසා එම සංඛ්‍යාත්මක දත්ත එකී මානව අතීතය ගොඩනැගීමට දායකත්වයක් සපයන බැවිනි. එහි දී පබළුන් හි විශ්කම්භය, දිග, සිදුර සිට විශ්කම්භයට ඇති දුර, පරිමිතිය යන අංශ

යටතේ පබළුවල ප්‍රමාණයන් ගණනය කරන ලදී. මෙකී ගණනය කිරීම් සඳහා අවශ්‍ය මිනුම් ලබා ගැනීමට Master Craft (58-68004) නම් මිනුම් උපකරණය යොදා ගන්නා ලදී.

**කාලය**

පහළ කිරිඳිඔය නිම්නය තුළ සිදු කරන ලද කැණීම් මාලාවේ දී කැණීම් ක්ෂේත්‍ර ස්ථාන අටෙහි කැණීම් සඳහා ලබා දී තිබෙන රේඩියෝ කාබන් කාලනිර්ණයන් මෙහි දී හමු වූ පබළු සඳහා ද උපයෝගී කර ගත් අතර ඊට අදාළව පහළ කිරිඳිඔය නිම්නය ආශ්‍රිතව ප්‍රධාන සංස්කෘතික අදියර හතක් හඳුනාගෙන ඇත.

- පළමුවන අවධිය -මුල්කාලීන කෘෂිකාර්මික ගම්මාන අවධිය (ක්‍රි.පූ 900 -500)
- දෙවන අවධිය -මුල්කාලීන කෘෂිකාර්මික-මුල්කාලීන නාගරික සංක්‍රාන්තික අවධිය (ක්‍රි.පූ 500 - 350)
- තෙවන අවධිය -මුල්කාලීන නාගරික අවධිය (ක්‍රි.පූ 350 -250)
- සිව්වන අවධිය -පරිණත නාගරික අවධිය (මුල් කොටස) - (ක්‍රි.පූ 250 - ක්‍රි.ව 350)
- පස්වන අවධිය -පරිණත නාගරික අවධිය (මැද කොටස) - (ක්‍රි.ව 350 -600)
- හයවන අවධිය -පරිණත නාගරික අවධිය (අවසන් කොටස) - (ක්‍රි.ව 600 -1000)
- හත්වන අවධිය -නාගරිකත්වයේ පිරිහීම(ක්‍රි.ව 1000 -1400) (Somadeva,2006,180.)

**විශ්ලේෂණය**


තෝරා ගත් පබළු නියැදිය ක්‍රමවේදය තුළ ආකෘතිය, අමුද්‍රව්‍ය හා ප්‍රමාණය යන මූලික කාරණා කිහිපයක් මත පදනම්ව අධ්‍යයනය

සිදු කර එය අමුද්‍රව්‍ය (Medium) හැඩය :Type ) Wm yevh ^Sub Type ) යන විචල්‍යයන් යටතේ විශ්ලේෂණය කිරීම සිදුකරන ලදී.

**අමුද්‍රව්‍ය විශ්ලේෂණය**

පබළු නියැදියේ අමුද්‍රව්‍ය ගණනාවකට අයත් වන පබළු පවතින අතර ඒවා මැටි, ශිලා, දත්, ඇටකටු, වීදුරු, දැව සහ ලෝහ වේ (ප්‍රස්තාර අංක 1). මේ අතරින් පබළු නිර්මිත අමුද්‍රව්‍යවලින් වැඩි ම සංඛ්‍යාවක් නිර්මාණය වී ඇත්තේ ශිලා පදනම් කොට ගෙන ය. එමෙන් ම ශිලාවලින් නිර්මාණය කරන ලද මෙම පබළු ශිලාවර්ග ගණනාවකින් නිර්මාණය කරන ලද ඒවා, ඒ අතර වේ. එනම් ඇමොසනයිට් (Amazonite), ඇගේට් (Agate), අමතෙස්ත (Ametheyst), ග්‍රැනයිට් (Granet) හා ක්වාට්ස් (Quartz) මෙවැනි ශිලා වර්ග ගණනාවකින් නිර්මාණය කරන ලද වැඩි ම පබළු සංඛ්‍යාවක් භාවිතා වූ කාලය සම්බන්ධව සැලකීමේ දී ඒවා හමු වී ඇත්තේ හත්වන අවධිය වශයෙන් සැලකෙන ක්‍රි.වත 950 - 1400 අතර කාල පරාසයෙනි. මේ කාලය තුළ දී නිර්මිත පබළු දාසයක් පමණ හඳුනා ගෙන තිබිණි.

තව ද තුන්වන අවධිය ලෙස සැලකෙන ක්‍රි.පූ. 350 -250 ත් අතර කාලයේ සහ හයවන අවධිය ලෙස සැලකෙන ක්‍රි.ව. 600 -950ත් අතර කාලයේ දී පබළු 15 බැගින් ශිලා භාවිතයෙන් නිර්මිත ඒවා හමු වී තිබෙන අතර ප්‍රධාන අවධි හත අතරින් දෙවැනි තැනට වැඩි ම ශිලා පබළු සංඛ්‍යාවක් ලැබී ඇත්තේ මෙම අවධිවලිනි. තව ද ක්‍රි.පූ. 900 -500 අතර කාලයේ නිර්මිත එක් පබළුවක් පමණක් ලැබී තිබේ. කෙසේ නමුත් ශිලාමය පබළු ප්‍රධාන අවධීන් හතට අදාලව සෑම කාල පරාසයකින් ද ලැබී තිබීම විශේෂ කරුණකි. එනම් ක්‍රිස්තු පූර්ව 900 සිට ක්‍රි.ව. 1400 දක්වා ම මෙම අමුද්‍රව්‍යය පදනම් කොට ගෙන මේවා නිර්මාණය කර තිබෙන බව හඳුනාගත හැකි විය (ප්‍රස්තාර අංක 2).





ප්‍රස්තාර අංක 1 පබළුවල අමුද්‍රව්‍ය භාවිතය

මැටියෙන් නිර්මිත පබළු සම්බන්ධව පහළ කිරිඳිඔය නිම්නය පදනම් කොට ගෙන සැලකීමේ දී සමස්ත පබළු ප්‍රමාණයෙන් පනස් හයක් පමණ නිර්මාණය වී ඇත්තේ මැටිවලිනි. (ප්‍රස්තාර අංක 3) එම ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් සඳහන් කළහොත් 37.8%කි. කාලයත් සමඟ මැටි පබළුන්හි භාවිතයේ ස්වභාවය සම්බන්ධව සැලකීම ඉතා වැදගත් කාරණාවක් වන අතර මේවා ප්‍රධාන අවධීන් හතට අදාළව මෙන් ම මතුපිට ස්තරයන්ගෙන් ද වාර්තා වී තිබීම සුවිශේෂී ය. ඒ අනුව ගත් විට වැඩි ම මැටි පබළු සංඛ්‍යාවක් තුන්වන අවධිය ලෙස සැලකෙන ක්‍රි.පූ. 350-250ත් අතර කාලයේ හමු වීමෙන් ඒවායේ භාවිතය ඒ කාලවකවානුව තුළ අනෙක් අවධීන්වලට සාපේක්ෂව වැඩි බව සංඛ්‍යාව 56ක් වන සමස්ත මැටි පබළු නියැදියෙන් ඉන් 29 ක ප්‍රමාණයක් තුන්වන අවධියෙන් නියෝජනය වීමෙන් හඳුනාගත හැකි ය. දෙවනුවට වැඩි ම සංඛ්‍යාවක් හයවන අවධියෙන් හමු වී ඇති අතර එනම් ක්‍රි.ව. 600-950ත් අතර කාලයෙනි. සංඛ්‍යාත්මක වශයෙන් පබළු දහයකි.


තව ද මැටි පබළුන්හි හඳුනාගත හැකි විශේෂත්වයක් වන්නේ

ක්‍රිස්තු පූර්ව 900 -500 වශයෙන් සැලකෙන පළමුවන අවධියෙන් එක් පබළුවක් වාර්තා වීම ය. එනම් එය තඹරාව කැණීම් ක්ෂේත්‍රයෙන් හමු වී තිබේ (TB 78) (ඡායාරූප අංක 1). තව ද මැටි පබළු සම්බන්ධව විශ්ලේෂණයේ දී හඳුනාගත හැකි අනෙක් විශේෂ ලක්ෂණය වූයේ මතුපිට ස්තරවලින් පබළු හතක් පමණ හමු වී තිබෙන අතර ඒවා හමු වී තිබෙන්නේ ද තඹරාව කැණීම් පරිශ්‍රයෙනි. (TB 86, TB 80, TB 84, TB 82, TB 83,TB 85, TB 86) එමෙන් ම මෙම කැණීම් ක්ෂේත්‍රයට අදාළව මැටි පබළු සම්බන්ධව සැලකීමේ දී ඒවා හමු වී ඇත්තේ පළවන අවධිය සහ මතුපිට ස්ථරවලින් පමණි.




*TB/78 - Devision: Regular Rounded Bead,Circular Disc Spherical bead ,( Clay) , Dimensions:d.8.33 mm, L.1.44mm, M.R.5mm , P.26.48mm, Provenance: Tambarava contex 1(phase I)*

(ඡායාරූප අංක 1)




ප්‍රස්තාර අංක 2 කාලයත් සමග ශිලා පබළුවල උච්චාවචනයන්




ප්‍රස්තාර අංක 3 කාලයත් සමග මැටි පබළුවල උච්චාවචනයන්

වීදුරුවලින් නිර්මිත පබළු සම්බන්ධව සැලකීමේ දී සමස්ත පබළු නියැදියේ භාවිත අමුද්‍රව්‍ය අතරින් තෙවැනි තැනට වැඩි ම ප්‍රමාණයක් වාර්තා වන්නේ වීදුරු පබළු ය. ප්‍රමාණයෙන් දහයක්වන අතර ප්‍රතිශතයක් වශයෙන් ගත් විට සමස්ත පබළු නියැදියෙන් 6.62% ක් වන ප්‍රතිශතයකි. වීදුරු පබළු හමු වූ කාල පරාසයන් සම්බන්ධව සැලකීමේ දී පළවෙනි සහ දෙවෙනි අවධිය හැරුණු විට අනෙක් සෑම අවධියකින් ම වාර්තා වී තිබීම වැදගත් කරුණකි. ඒ අතරින් පස්වන අවධිය වශයෙන් සැලකෙන ක්‍රි.පූ. 350ත් ක්‍රි.ව. 600 ත් අතර කාලයේ පබළු හතරක් පමණ ලැබී තිබේ. කාලයත් සමග වීදුරු පබළුවල උච්චාවචනයන් සම්බන්ධයෙන් සැලකීමේ දී තුන්වන හා හතරවන අවධිවල සමාන ප්‍රමාණවලින් මෙම පබළු හමු වී තිබෙන අතර පස්වන අවධිය වනවිට පෙර අවධියට වඩා දෙගුණයකින් භාවිතය වැඩි වී ඇත. හයවන අවධියට ප්‍රවිෂ්ටවීමත් සමග ප්‍රාමාණික වශයෙන් පස්වන අවධියෙන් පබළු 5ක් හමු වුව ද හයවන අවධියෙන් එක් පබළුවක් පමණක් හමුවීමෙන් භාවිතය පහත වැටීමක් සිදු වී තිබෙන

බව හඳුනාගත හැකි ය.

නැවතත් හත්වන අවධිය තුළ ක්‍රි.ව. 950 -1400ත් අතර කාලයවන විට වීදුරු පබළු භාවිතය වැඩි වීමක් වාර්තා වන අතර සංඛ්‍යාත්මක වශයෙන් හයවන අවධියෙන් ද එක් පබළුවක් පමණක් හමු වුව ද හත්වන අවධිය වන විට එය තුනක් දක්වා නැවත වැඩිවීමක් හඳුනාගත හැකි ය. කෙසේ නමුත් වීදුරු පබළු තුන්වන අවධියේ සිට හත්වන අවධිය දක්වා කාල පරාසය තුළ එනම් ක්‍රි.පූ. 350 සිට ක්‍රි.ව. 1400 දක්වා භාවිතයේ උච්චාවචනයන් සිදු වී තිබෙනු මේ අනුව හඳුනාගත හැකි ය. වීදුරු පබළු හමු වූ ස්ථාන සම්බන්ධව සැලකීමේ දී කැණීම් ක්ෂේත්‍ර තුනකින් ඒවා වාර්තා වී තිබෙන අතර ඇල්ලේගල, පොල්බිඳින්වල හා කිරින්ද ඒ අතර වේ.


මෙම පබළු නියැදියේ දත් සහ ඇටකටුවලින් නිර්මිත පබළු හමු වන මුළු සංඛ්‍යාව 8 කි. මෙම දත්වලින් නිරිමිත පබළු අට හමු වී ඇති අතර කාලය සම්බන්ධයෙන් සැලකීමේ දී හත්වන අවධිය වශයෙන් සැලකෙන ක්‍රිස්තු වර්ෂ 900 - 1400ත් අතර කාල පරාසයෙන් හමු වී තිබේ. මෙම අමුද්‍රව්‍යයන්ගෙන් නිර්මිත පබළු හමු වන්නේ හතර සහ හත යන අවධීන්වලින් පමණක් වීම ද විශේෂිත කාරණාවකි. තව ද මේවායින් නිර්මිත පබළු දහතුනක් හමුවන්නේ ද කිරින්ද කැණීම් පරිශ්‍රයෙන් පමණකි. එමෙන් ම ඇටකටුවලින් නිර්මිත පබළු හමු වන අතර ඒවා කුමන ඇටකටුවලින් නිර්මාණය කරන ලද ඒවා ද? යන්න නිශ්චිතව ම කිව නොහැකි නමුත් හමු වී ඇති පබළු ප්‍රමාණය පහකි (ප්‍රස්තාර අංක 1 ).

පහළ කිරිඳිඔය නිම්නයෙන් ලැබුණු පබළු අතර දැව භාවිතයෙන් නිර්මාණය කරන ලද පබළු එකක් පමණ වාර්තා වී තිබෙන අතර (ප්‍රස්තාර අංක 1) ඒවා ප්‍රතිශතයක් වශයෙන් ගත්විට 0.66%ක් තරම් වූ සුළු ප්‍රමාණයකි. කෙසේ නමුත් මෙම හමු වී තිබෙන පබළුව කිරින්ද කැණීම් පරිශ්‍රයෙන් හතරවන අවධියට අයත් ක්‍රි. පූ. 250ත් ක්‍රි. ව. 350 කාලයට අයත් පාංශු සන්දර්භය තුළින් හමු වී තිබේ. මෙම කැණීම් මාලාව තුළින් එක් ලෝහ පබළුවක් පමණක් හමුවී තිබෙන අතර එය( ප්‍රස්තාර අංක 1) ද හත්වන අවධිය වශයෙන් සැලකෙන ක්‍රිස්තු වර්ෂ 900 - 1400ත් අතර පාංශු සන්දර්භවලින් හමු

වී තිබේ. කැණීම් ස්ථාන 8න් කිරින්දෙන් පමණක් මෙම ලෝහමය පබළුව හමු වීම ද වැදගත් කාරණාවක් වශයෙන් හඳුනාගත හැකි ය.

## හැඩ විශ්ලේෂණය

තෝරාගත් පහළ කිරිඳිඔය නිම්නයට අදාල පබළු නියැදියේ පබළු එකිනෙක ගෙන වර්ගීකරණයට භාජනය කළ විට තෝරාගත් ක්‍රමවේදයට අනුව මූලික හැඩ අටකට අයත් වන පබළු හඳුනාගත හැකි විය. එම හැඩ අතරින් වැඩි ම පබළු ප්‍රමාණයක් වෘත්තාකාර හැඩය ගන්නා පබළු වේ. ඒ අතරින් චතුරස්‍රාකාර, කාචාකාර හා බහුවිධ හැඩයක් ගන්නා පබළු එක බැගින් වාර්තා වී තිබේ. ( ප්‍රස්තාර අංක 4 පබළුවල ප්‍රධාන හැඩතල)




ප්‍රස්තාර අංක 4 පබළුවල ප්‍රධාන හැඩතල

ඉහත කොටසේ අමුද්‍රව්‍ය විශ්ලේෂණයේ දී විවිධ අමුද්‍රව්‍ය යොදාගෙන මේවා නිර්මාණය කර තිබෙන බව පැහැදිලි වූ අතර ඒවා අතරින් මැටි පබළු නිර්මාණය කර තිබෙන මූලික හැඩ සම්බන්ධව සැලකීමේ දී වෘත්තාකාර, බීජාකාර, ඉලිප්සාකාර සහ වෘත්තාකාර සමතලා හැඩයන් ගන්නා පබළු මැටි උපයෝගී කොටගෙන නිමවා තිබේ. සංඛ්‍යාත්මක වශයෙන් ගත් විට මෙම හැඩ අතරින් වැඩි ම මැටි පබළු සංඛ්‍යාවක් වෘත්තාකාර පබළු ය. එය 89.99%කි. මෙම අමුද්‍රව්‍යයෙන් නිර්මිත පබළු අතර ඉලිප්සාකාර හැඩයක් ගන්නා පබළු 1.78%ක් තරම් වූ සුළු ප්‍රමාණයකි.

ශිලා අමුද්‍රව්‍ය කොටගෙන නිර්මාණය කරන ලද පබළුවල මූලික හැඩයන් සම්බන්ධව සැලකීමේ දී ප්‍රධාන හැඩ 8 අතරින් බහුවිධ හැඩය ගන්නා පබළු වර්ගය හැරුණු විට අනෙක් සියලු ම හැඩයන්ගෙන් සමන්විත පබළු හමු වී තිබේ. චතුරස්‍රාකාර, කාචාකාර හා බීජාකාර යන හැඩයන් සහිත ශිලා පබළු හමු වී ඇත්තේ එක බැගිනි. ශිලා අමුද්‍රව්‍ය මුල් කොටගෙන නිර්මාණය කරන ලද පබළු අතර වැඩි ප්‍රමාණයක් වෘත්තාකාර හැඩය ගනී. ප්‍රතිශතයක් වශයෙන් ගත් විට 15.69%ක් පමණ ප්‍රමාණයකි. මැටි පබළු සමග සංසන්දනය කිරීමේ දී ඉලිප්සාකාර හැඩය ගන්නා පබළු අඩු ප්‍රමාණයක් වාර්තා වුව ද ශිලා පබළුවල හැඩ අතර ඉලිප්සාකාර හැඩය ගන්නා පබළු අනෙක් හැඩවලට වඩා වැඩි ය.


එමෙන් ම දත් උපයෝගී කොටගෙන නිර්මාණය කරන ලද පබළුන්හි හැඩයන් සම්බන්ධව සැලකීමේ දී වෘත්තාකාර හැඩය ගන්නා පබළු පමණක් දක්නට ලැබෙන අතර වෘත්තාකාර හැඩයට අදාල වන අනු හැඩ ඒ තුළ අන්තර්ගත වේ. එමෙන් ම ඇටකටු මගින් නිර්මාණය කරන ලද පබළුන්හි හැඩයන් සම්බන්ධව සැලකීමේ දී වෘත්තාකාර සහ වෘත්තාකාර - සමතලා යන හැඩයන් ගන්නා පබළු මේවා මගින් නිර්මාණය කර තිබේ. වීදුරුවලින් නිර්මාණය කරන ලද පබළුන්හි හැඩ ගත් විට වෘත්තාකාර, වෘත්තාකාර - සමතලා, බීජාකාර, ඉලිප්සාකාර සහ නාලාකාර යන හැඩයන්ගෙන් සමන්විත ය. ඒ අතරින් වැඩි ප්‍රමාණයක හැඩය වෘත්තාකාර ය.

තව ද තෝරාගත් පබළු නියැදියේ එක් එක් හැඩයන් ගන්නා පබළු හමු වූ කැණීම් ක්ෂේත්‍ර සම්බන්ධව ද වෙන වෙන ම විශ්ලේෂණය කරන ලදී. සමස්තයක් ලෙස වෘත්තාකාර පබළු 119 ක පමණ ප්‍රමාණය කිරින්දගොඩාන, කිරින්ද, තඹරාව, ඇල්ලේගල සහ පොල්බිඳින්වල යන කැණීම් පරිශ්‍රයන්වලින් හමු වී ඇත. ඒ අතුරින් වැඩි ම ප්‍රමාණයක් හමු වී ඇත්තේ කිරින්ද වරාය ආශ්‍රිත ක්ෂේත්‍රයෙන් වන අතර සංඛ්‍යාත්මක වශයෙන් ගත්විට පබළු 53කි. එම ක්ෂේත්‍ර පහ අතරින් අඩු ප්‍රමාණයක වෘත්තාකාර පබළු ලැබී ඇත්තේ ඇල්ලේගල කැණීම් පරිශ්‍රයෙනි. එය ප්‍රතිශතයක් ලෙස 44%කි. බීජාකාර හැඩය ගන්නා පබළු සම්බන්ධව සැළකීමේ දී සමස්ත පබළු ප්‍රමාණය 3කි. ඉන් දෙකක් ම වාර්තා වන්නේ කිරින්දෙන් වන අතර අනෙක් ස්ථානය

පොල්බිඳින්වල ය.

ඉලිප්සාසාකාර පබළු ස්ථාන හතරකින් වාර්තාවන අතර ඉන් වැඩි ම ප්‍රමාණයක් කිරින්දෙන් නලාකාර හැඩය ගන්නා පබළු කිරින්දගොඩාන හා ඇල්ලේගල යන ස්ථාන දෙකෙන් පමණක් වාර්තා වී තිබේ. එම හැඩැති පබළු ප්‍රමාණය තුනකි. එමෙන් ම මෙම පබළුවල ප්‍රධාන හැඩයන් සම්බන්ධව සැලකීමේ දී කිරින්ද කැණීම් ක්ෂේත්‍රයෙන් පමණක් ප්‍රධාන හැඩ තුනකට අදාළවන  නාලාකාර පබළු හඳුනා ගත හැකි විය. එනම්, බීජාකාර පබළු, ඉලිප්සාකාර පබළු හා නාලාකාර පබළු යන හැඩයන් ය.


ඒ අනුව සමස්තයක් වශයෙන් ගත්විට මෙම හැඩ අටට අදාළ පබළු භාවිත වූ කාලය සම්බන්ධව සැලකීමේ දී වැඩි ම පබළු සංඛ්‍යාවක් තුන්වන අවදිය වශයෙන් සැලකෙන ක්‍රි. පූ. 350-250ත් අතර කාලයේ භාවිත වී තිබෙන බවත් අවම පබළු සංඛ්‍යාවක් පළමුවන අවධිය ලෙස සැලකෙන ක්‍රි. පූ. 900-500 අතර කාලයේ භාවිතා වී තිබේ.( ප්‍රස්තාර අංක 5)




ප්‍රස්තාර අංක 5 කාලයත් සමඟ සමස්ත පබළුවල භාවිතය

**උප හැඩ විශ්ලේෂණය**

පබළු නියැදියේ පබළුවල මූලික හැඩවලට අමතරව එම හැඩ තුළින් පෙනෙන උප හැඩ ගණනාවක් ද වර්ගීකරණය කිරීමේ දී හඳුනාගත හැකි වූ අතර එනම් සිලින්ඩරාකාර හැඩැති පබළු, ගෝලාකාර හැඩැති පබළු, පැතළි ගෝලාකාර හැඩැති පබළු, බැරල් හැඩැති පබළු, ඉලිප්සාකාර හැඩැති පබළු, දෙපස කර සහිත හැඩැති පබළු, පෙයාස් හැඩැති හැඩැති පබළු හා පුරුක් සහිත හැඩැති පබළු යන උප හැඩ ඒ අතර විය. මෙකී උප හැඩ වර්ග අතරින් වැඩි ම පබළු සංඛ්‍යාවක උපහැඩය වූයේ පැතළි ගෝලාකාර හැඩය වන අතර දෙපස දාර සහිත හැඩය සහ පෙයාර්ස් හැඩය ගත් විට ඒවා එක බැගින් විය. ( ප්‍රස්තාර අංක 6 )




ප්‍රස්තාර අංක 6 පබළු නියැදියේ අන්තර්ගත උපහැඩ

**නිගමනය**

ඉහත සඳහන් කරන ලද පර්යේෂණ ගැටලුව විසඳීම සඳහා පුරාණ මාගම නගරයෙන් ලද පබළු නියැදියට අදාළව පබළු තුළින් පුරාණ මාගම නගරයේ සංස්කෘතිය කෙතරම් දුරට හෙළිදරව් කරනවා ද? යන්න විමසා බැලීමේ දී ප්‍රධාන අවධීන් 7 ට ම අදාල සාධක ලැබී තිබෙන බව ඉහත විස්තර වූ අතර ඉන් පළමු අවධිය වශයෙන් සැලකෙන ක්‍රි.පූ. 900-500 ත් අතර කාලය පූර්ව ඓතිහාසික යුගය නියෝජනය වේ. මෙම අවධිය තුළින් මූලික වශයෙන් ඒකාකාරී ජීවන

රටාවක් වෙනුවට අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට හැකි ආර්ථික ක්‍රමවේදයක් සකස් කර ගැනීමට දරන ප්‍රයත්නය තුළින් හමු වූ සාධක කැණීම් මගින් තහවුරු කරගෙන ඇත. පූර්ව ඓතිහාසික යුගය තුළ හඳුනාගත හැකි මූලික කාරණා අතර වන සංවිධානාත්මක දඩයම, සීමිත කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය, සීමිත ධීවර කර්මාන්තය, යකඩ භාවිතය හා තාක්ෂණය, විශේෂ මැටි බඳුන් තාක්ෂණය, දියුණු ජනාවාස, සුසානභූමි ගොඩනැගීම, ශිල්පීය භාණ්ඩ නිෂ්පාදනය (විජේතුංග,2014,45-56) ඒ අතර වේ. මෙම කාරණා අතරින් පුරාණ මාගම නගරයේ ශිල්පීය භාණ්ඩ නිෂ්පාදනයේ සුවිශේෂිතා පබළු පදනම් කොට ගෙන අධ්‍යයනය කළ හැකි ය. පබළු නියැදියෙන් මෙම අවධිය නියෝජනය කරනු ලබන එක් මැටි පබළුවක් සහ එක් ශිලා පබළුවක් පමණක් ලැබී තිබේ. ඒවා ලැබී ඇත්තේ තඹරව සුසාන භූමිය ආශ්‍රිතව සිදුකරන ලද කැණීම මඟිනි. ඒ අනුව වෙනත් කැණීම් ක්ෂේත්‍ර කිසිවකින් මේවා හමුනොවීමත් මෙම පූර්ව ඓතිහාසික යුගය නියෝජනය කරනු ලබන සුසාන භූමියෙන් හමු වීමත් වැදගත් කාරණාවකි. එනම් ශිලා සහ මැටිවලින් නිර්මිත පබළු මෙම ස්ථානයෙන් පමණක් හමු වූයේ කුමන කාරණාවක් නිසා ද? යන්න සැළකීම වැදගත් වේ. එහි දී ශ්‍රී ලංකාවේ මෙන් ම ලෝකයේ ද පූර්ව ඓතිහාසික යුගය නියෝජනය කරනු ලබන සුසාන භූමිවලින් පබළුවල සාධක බහුල ලෙස හමු වී ඇත.

බොහෝ විට ඒවා මියගිය පුද්ගලයාගේ භස්මාවශේෂ තැන්පත් කරන ලද බරණි තුළ තැන්පත් කර තිබෙන නිසා විද්වතුන් අදහස් කරන්නේ ආගමික විශ්වාස මත එලෙස තැන්පත් කරන්නට කටයුතු කර ඇති බව ය. එම කාරණාව මෙම තඹරව සුසාන භූමියෙන් ලද පබළුවලට ද අර්ථ දක්වන්නේ නම් පුරාණ මාගම වැසියාගේ අභිචාර විධියක් ලෙස පබළු මෙකල යොදා ගන්නට ඇත. මෙහි ලා සඳහන් කළ යුතු විශේෂ කාරණාවක් වන්නේ මේ වන විට ලංකාවේ ස්ථිර දර්ශනයකින් යුක්ත සංවිධානාත්මක ආගමක් නොපැවතීම නිසා මෙම අවධිය තුළ ඉහත සඳහන් කරන ලද ලක්ෂණ අත්පත් කරගත් පූර්ව ඓතිහාසික යුගයේ මිනිසා යම් ඇදහිල්ලක් ලෙස මළවුන් පිදීම සඳහා මේවා භාවිත කරන්නට ඇති බව ය.

අනතුරුව පුරාණ මාගම වැසියාගේ තොරතුරු අනාවරණය වූ

දෙවන අවධිය වශයෙන් සැලකෙන ක්‍රි. පූ. 500-350 අතර මුල්කාලීන කෘෂිකාර්මික හා මුල් කාලීන නාගරික සංක්‍රාන්තිය අවධිය හා තුන්වන අවධිය වශයෙන් සැලකෙන ක්‍රි. පූ. 350-254ත් අතර මුල්කාලීන නාගරික අවධිය යන අවධීන් ද්විත්වය තුළින් පබළු සම්බන්ධව කාරණා කීපයක් ප්‍රත්‍යක්ෂ කර ගත හැකි විය.

මහාවංසයට අනුව විජය තම්බපණ්ණි සිට මෙරට පාලනය කරන කාලය වන විට අනුරාධපුර ග්‍රාමය හා රෝහණය තරමක දියුණු ශිෂ්ඨාචාරයක ලක්ෂණ අත්පත් කර ගෙන තිබී ඇත. රෝහණය සම්බන්ධව මෙහි දී විශේෂ අවධානය යොමු කළ යුත්තේ රෝහණයේ අගනගරය "මාගම" ලෙස දැනට හඳුනා ගෙන ඇති නිසා ය. මෙකී කරුණ වැදගත් වන්නේ දේශීය ජනතාවගෙන් ජනාවාස වී පැවැති රෝහණය, රෝහණ කුමාරයාගේ පැමිණීමත් සමග යම්තාක් දුරට වෙනස්කම් ඇති වන්නට හේතු වීම නිසා ය. මෙම තත්ත්වය පුරාණ මාගම නගරය ආශ්‍රිත ප්‍රදේශවලට ද බලපා තිබේ. එනම් ඉන්දියාවේ සිට මෙහි පැමිණි මෙම කණ්ඩායම මගින් ඉන්දීය සංස්කෘතිකත්වය මත පිහිටා මෙරට කටයුතු කිරීම නිරාසයෙන් සිදුවන්නකි. ඒ අනුව ඉන්දීය හා සිංහල සංස්කෘතිය මිශ්‍රවීමක් ප්‍රථම වරට පුරාණ මාගම ආශ්‍රිතව අපට හඳුනා ගැනීමට හැකි වන්නේ මෙකල ය. තව ද පර්යේෂණයට අදාළවන පබළු නියැදිය ගත් විට එහි මේ අවධිය නියෝජනය කරනු ලබන පබළු අටක් පමණ ලැබී ඇති අතර ඒවා ශිලා සහ මැටි මාධ්‍යයෙන් නිර්මාණය කරන ලද ඒවා ය.

තව ද මෙම පබළු මෙවන් දේශපාලනික හා සංස්කෘතික වටපිටාවක් පැවති මාගම තුළ මෙම අවධියේ නිර්මාණය කර තිබීම සම්බන්ධයෙන් සැලකීමේ දී මැටි පබළු සංඛ්‍යාව දෙකක් වන විට ශිලා පබළු 8 ක් වීමෙන් පහළ කිරිඳි ඔය නිම්නය ආශ්‍රිතව ආදි මිනිසා මේ කලාපයට උරුම වූ නව ඉන්දීය සංස්කෘතිය මේ අවධිය තුළ ම වැළඳගත්තා යැයි සිතිය නොහැක. ඒ මක්නිසාදයත් ඉන්දීය සංස්කෘතිය ඔවුන් මිශ්‍ර වූවා නම් වැඩි සංඛ්‍යාවක් තිබිය යුත්තේ මැටි පබළු ය. එසේ වීමට හේතුව වන්නේ මේ කාලයට සමගාමීව ඉන්දියාව පාලනය කරනු ලබන්නේ බිම්බිසාර රජ පෙළපතේ අනුරුද්ධ හා මුණ්ඩුක (ක්‍රි.පු 40 -48) යන පාලකයින් ය(සුමනසාර, 1968,36). එනම් එවකට දඹදිව ඉතා දියුණු මැටි බඳුන් තාක්ෂණයක් පැවති බව ඉන්දීය

ඉතිහාසය පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වේ.

මේ ආකාරයට මගධ රාජ්‍ය ක්‍රමයෙන් සංවර්ධනයට පත්ව තිබූ අවධියක ඉන්දියාවේ සිට පැමිණි භද්දකච්චානා කුමරියගේ සහෝදරයෝ එකී තාක්ෂණ විධි හා කර්මාන්ත දැන නොසිටියා යැයි කිව නොහැක. ඔවුන් එකී කාරණාවන් පිළිබඳව අවබෝධයෙන් සිටිය ද ඔවුන් පැමිණ රෝහණය ආශ්‍රිතව ජනාවාස පිහිටුවා ගත් කාලයේ එකී සංස්කෘතික ආභාසයන් මෙරටට ආරෝපණය කරන්නට නොමැති බව මැටි පබළු සංඛ්‍යාව අවම වීමෙන් පැහැදිලි කරගත හැකි ය. අනතුරුව පුරාණ මාගම නගරය සම්බන්ධව සඳහන් කිරීමේ දී තවමත් ග්‍රාමීය තත්ත්වයක පවතින මෙම ජනාවාස සහිත දකුණු දිග කලාපයේ පහළ කිරිඳිඔය නිම්නය, පණ්ඩුකාභය රජු අනුරාධපුරයේ රාජ්‍යත්වයට පත්වන වකවානුව වන විට ද එලෙස ග්‍රාමීය මට්ටමේ තිබී ඇත.

එනම් ප්‍රථම වරට අනුරාධග්‍රාමය නගරයක් බවට පත් කරන පණ්ඩුකාභය රජු මෙරට ප්‍රථම නගර නිර්මාපකයා විය. මෙම අවධිය සම්බන්ධව සැලකීමේ දී ක්‍රි. පූ. 350ට පූර්ව වකවාණුවේ අනුරාධපුර පාලකයා වූයේ දේවානම්පියතිස්ස රජු ය(ක්‍රි.පූ 236 -376). මෙකල, මෙරට දේශපාලනික, ආගමික, ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් සෑම අංශයක ම විශාල වෙනස්කම් රාශියක් ඇති විය. එකී විෂමතාවන් සම්බන්ධව පුරාණ මාගම නගරයට අදාලව විමසීමේ දී දේවානම්පියතිස්ස රජුට අනුරාධපුරයේ පූර්ණ බලයක් තිබුණ ද අනෙක් ඇතැම් ඒකකවල පාලකයින් ඔහුගේ ආධිපත්‍යය පිළිගෙන සිටි බවට ශ්‍රී මහාබෝධිය ශාඛාව රෝපණය කිරීමේ උත්සවයට දේවානම්පියතිස්ස රජුගේ ආරාධනයෙන් කතරගම හා චන්දනගාම ක්ෂත්‍රිකයින් අනුරාධපුරයට පැමිණ තිබීමෙන් පැහැදිලි වේ (අහුබුදු,ගුණවර්ධන ,චන්ද්‍රසේකර, 1993,244).

ඒ අනුව "කතරගම" වූ කලී රෝහණ රාජ්‍යයට අයත් පුරාණ මාගමට ආසන්න ප්‍රදේශයක් වීමත් එකී ආගමික කාරණා කතරගම වටා කලාපය තුළ ම ව්‍යාප්ත වන්නට ඇත. එනිසා පුරාණ මාගමට ද බුදු දහම සම්බන්ධව දැනුවත්භාවය ලැබෙන්නට ඇති නමුත් මහින්දාගමනය හා දුමින්දාගමනය සමඟ මෙරටට ලැබුණු සංස්කෘතික

ආභාසයන් කොතෙක් දුරට ව්‍යාප්ත වූවා ද යන්න සැලකීමේ දී මෙම අවධියට අයත් පාංශු ස්ථර තුළින් විවිධාකාරයේ කලාකෘතීන් හමු වුව ද පබළුවල සාධක අවමවීම නිසා පබළුවලට මේ වකවානුව තුළ පුරාණ මාගම එතරම් කැපී පෙනෙන ස්ථානයක් හිමිව නොතිබුණු බව හඳුනාගත හැකි ය.

දෙවන අවධිය වශයෙන් සැලකෙන ක්‍රි.පූ 500-350ත් අතර කාලවකවානුවේ පුරාණ මාගම ආශ්‍රිතව සංස්කෘතිය තුළ "පබළු" නිර්මාණය සහ භාවිතය සඳහා පුළුල් වපසරියක් නොතිබුණු අතර වරින්වර ඉන්දීය සංස්කෘතික ආභාසයන් මේ ප්‍රදේශයන් වෙත ප්‍රවිශ්ට වුව ද පුරාණ මාගම වැසියා ඒවා පබළු නිර්මාණකරණය සඳහා ග්‍රහණය කර ගැනීමක් සිදු කර ගෙන නොමැත. එමෙන් ම මේ කාලය වනවිට ද තවමත් ග්‍රාමීය මට්ටමේ පවතින පුරාණ මාගම තුළ විසූ වැසියාට පුළුල් වූ අවශ්‍යතාවයන් නොතිබීම නිසා මූලික අවශ්‍යතා අතර ආහාර සපයා ගැනීමත් ඊට අවශ්‍ය කරනු ලබන භෞතික සම්පත් ළඟා කර ගැනීමත්, ජීවත්වීමට අවශ්‍ය වාසස්ථාන ගොඩනගා ගැනීමත් යන සීමිත අවශ්‍යතා පමණක් පැවතීම නිසා ඔවුන්ගේ දෛනික ජීවිතය තුළ "පබළු" එතරම් එවකට පුරාණ මාගම සංස්කෘතිය තුළ ඉස්මතු නොවූණු බව මනාව මෙමඟින් හඳුනා ගත හැකි ය.

තුන්වන අවධිය සම්බන්ධව සැලකීමේ දී ක්‍රි.පූ 350-250 අතර කාල පරිච්ඡේදයේ දී පුරාණ මාගම ආශ්‍රිතව නාගරික ලක්ෂණ ක්‍රමයෙන් ඉස්මතු වීමක් හඳුනාගත හැකි ය. මෙම කාලය තුළින් පහළ කිරිඳිඔය නිම්නය ආශ්‍රිතව හමු වූ සමස්ත පබළු නියැදියේ වැඩි ම පබළු සංඛ්‍යාව වාර්තා වේ. එහි හමු වූ පබළු නිර්මිත අමුද්‍රව්‍ය විශ්ලේෂණයේ දී ප්‍රධාන අමුද්‍රව්‍ය හතෙන් මැටි, ශිලා හා වීදුරු යන අමුද්‍රව්‍ය තුනෙන් නිර්මිත වූ ඒවා හමු වූවාක් මෙන් ම මෙහි මැටි පබළු සංඛ්‍යාව මෙම අවධිය වන විට ශිලා පබළුවලට වඩා ක්‍රමයෙන් ඉහළ ගොස් තිබීම විශේෂ කාරණාවක් වේ.

මෙම අමුද්‍රව්‍ය භාවිතය හා පබළු නිර්මාණකරණය සම්බන්ධව සැලකීමේ දී මැටිපබළු වැඩි වශයෙන් නිර්මාණය කොට භාවිත කර තිබීමෙන් පැහැදිලි වන්නේ ක්‍රමයෙන් නාගරික ජීවිතයකට අවතීර්ණවන පුරාණ මාගම වැසියාට වැදගත් අංගයක් බවට පබළු

මේ වන විට පත් වී ඇති බව ය. එමෙන් ම තුන්වන අවධිය තුළ දී නාගරිකත්වයට අවතීර්ණ වූ මාගම තුළින් මුල් මාගම වැසියාට වඩා ඔබ්බට ගිය සංස්කෘතිකමය විවිධත්වයක් සහිත පුරවැසියෙක් මේ වන විට නිර්මාණය වී තිබීම ද හඳුනා ගත හැකි ය. නගරයක් නිර්මාණයවීමට බලපානු ලබන කාරණා සම්බන්ධව සඳහන් කරන ගෝල්ඩන් චයිල්ඩ් ප්‍රකාශ කරනු ලබන නිර්ණායක දහය මේ වන විට පුරාණ මාගම නගරය තුළින් හඳුනාගත හැකි ය. එකී කාරණා 10 ක්‍රමයෙන් ප්‍රතිෂ්ඨාපනය වන්නේ මෙම තුන්වන අවධිය වශයෙන් සැලකෙන මුල්කාලීන නාගරික අවධිය තුළ වන අතර මෙම කාරණා 10 ඇතිවීමත් සමඟ නගර බිහිවනවා පමණක් නොව නාගරික පුරවැසියාගේ අවශ්‍යතා මත පබළු නිර්මාණය හා භාවිතයට එළඹීම ද සිදු වී ඇත. මේ බව පුරාණ මාගම නගරයට අදාළව ලැබුණු පබළු නියැදිය මඟින් හඳුනාගත හැකි විය. මෙකී කාරණා දහය සම්පූර්ණ වී පුරාණ මාගම නගරය බිහිවීමේ දී කලාකෘති නිර්මාණය වීමත් සමඟ ශිල්ප ප්‍රගුණතාවයක් හෙවත් විශේෂඥ දැනුම ඇති ශිල්පීන් බිහි වීම සම්බන්ධව සැලකීමේ දී නිර්මාණය වූ කලා කෘති අතර පබළු මේ අවධිය යටතේ වැදගත් වේ.

එනම් විවිධ අමුද්‍රව්‍ය, විවිධ හැඩ සහ විවිධ ප්‍රමාණ සහිතව මේවා නිර්මාණය කරන්නට නම් මේ අවධියේ ඒ සඳහා කුසලතා සපිරි ශිල්පීන් මේ පුරාණ නගරය ආශ්‍රිතව ජීවත්ව සිටින්නට ඇත. එනම් පබළුවේ මධ්‍යයේ වන සිදුර සකස් කරගැනීම සඳහා ඉතා සියුම් මෙවලමක් යොදා ගෙන වෘත්තාකාර, බීජාකාර, ඉලිප්සාකාර, චතුරස්‍රාකාර, නලාකාර, කාවාකාර හා බහුවිධ යන හැඩතලවලට අදාළව පබළු මැනීම්, සීරීම්, කැපීම්, මුවහත් කිරීම් හා තැලීම් හරහා නිර්මාණය කර තිබෙන බව හඳුනාගත හැකි ය. එමෙන්ම ඔවුන් මේ අවධියේ පබළු කුමක් අරභයා භාවිත කළේ ද? යන්න නිශ්චිතව කිව නොහැකි නමුත් කෙන්ද්‍රකට සම්බන්ධ කර අමුණා පැළඳීමට යොදා ගන්නට ඇති බව සිතීමට වැඩි ඉඩකඩක් පවතින්නේ පබළුවේ මුහුණ පැත්ත දීර්ඝ කාලයක් භාවිත කර ඇති බවත් ඒවා නැවත නැවත හැඩ ගන්වමින් භාවිතයට ගෙන තිබෙන බවට ද සාධක පවතින නිසාවෙනි.

ඉන් ඉක්බිතිව එළඹෙන්නේ හතරවන අවදිය වශයෙන් සැලකෙන පරිණත නාගරික අවධියේ මුල් කොටසට ය. එනම්

ක්‍රිස්තු පූර්ව 250ත් ක්‍රි. ව. 350ත් අතර වසර 1100ක පමණ කාලයක් අන්තර්ගතවන පරිච්ඡේදයකට ය. මෙකල දේශපාලනික වශයෙන් අනුරාධපුර රාජධානියේ විටින් විට ඇති වූ අස්ථායී තත්ත්වයක් තුළ පුරාණ මාගම නගරය කැපී පෙනෙන දායකත්වයක් මේ අවධිය තුළ ලබා දී තිබෙන බව මාගම පාලක කාවන්තිස්ස හා සබැඳි කතා පුවතින් මනාව තහවුරු වේ. කෙසේ නමුත් මේ අවධිය තුළ ජීවත් වූ පුරාණ මාගම නගරය වැසියා පාෂාණ භාවිතයෙන් පබළු නිෂ්පාදනය කිරීමේ දී අඹතේස්ත, ඇගේට්, ග්‍රැනයිට් වැනි අමුද්‍රව්‍ය යොදාගෙන පබළු නිර්මාණය කර තිබේ. අඹතේස්ත හා ඇගේට් වැනි ආනයනික අමුද්‍රව්‍යයන්ගෙන් නිර්මිත පබළු හමුවීමෙන් පැහැදිලි වන්නේ පුරාණ මාගම ආර්ථිකය තුළ දේශීය වෙළඳාම හැරුණු විට විදේශීය වෙළදාම ප්‍රමුඛ වූ බව ය.- කිරින්ද වරාය ආශ්‍රිතව සිදු කරන ලද කැණීම්වලින් පබළු හමුවීමෙන් පුරාණ මාගම නගරයේ ප්‍රධාන වරාය ලෙස කිරින්ද යොදා ගැනීම සිදුව ඇති බව තහවුරු වේ. තව ද මෙම පාෂාණ පබළු අතර ඇමොසනයිට් නම් ඇති පාෂාණ විශේෂය බහුල ය. විවිධ වර්ණයන්ගෙන් සමන්විත මේවා මඟින් ඉතා අලංකාරවත් ලෙස පළඳනාවන් නිමවා භාවිත කරන්නට ඇති බව සිතන්නට වැඩි ඉඩකඩක් පවතී.

එමෙන් ම ඉන්දියාව සමඟ ලංකාව විදේශ සම්බන්ධතා නිරන්තරව ම පවත්වන ලද අතර "වීදුරු" වැනි අමුද්‍රව්‍ය ඉහත සටහනට අනුව ඉන්දියාව, බටහිර ආසියාව සමඟ පවත්වන ලද සම්බන්ධතා මඟින් මේ කාලයේ ලබාගෙන ඇත. ඒ අනුව ඉන්දියාවෙන් මෙම වීදුරුවලින් නිර්මිත පබළු හෝ වීදුරු අමුද්‍රව්‍ය ලංකාවට විදේශ වෙළඳාම පදනම්ව ලැබී තිබෙන බව මෙහි ලා තහවුරු වේ. ඒ අනුව ගත්විට තුන්වන සහ හතරවන අවධි ද්විත්වය තුළ ම පුරාණ මානව සංස්කෘතියේ නාගරික ප්‍රජාවගේ අවශ්‍යතාවයන්ගේ සිදු වූ වෙනස්කම තුන්වන අවධියට සාපේක්ෂව නගරයක් බවට පරිවර්තනය වීමෙන් පැහැදිලිව ම වෙනස් වූ බව ලැබුණු පබළු මඟින් හඳුනාගත හැකි වූ අතර එනම්,

- නාගරික ජීවන ශෛලියක් හිමිවීම.
- ප්‍රාගුණ්‍යතාවයක් ඇති ශිල්පීන් පිරිසක් බිහිවීම.

- ස්වභාවිකත්වය අනුකරණය කරමින් කලා කෘති බිහිවීම.
- විදේශීය වාණිජ සම්බන්ධතා ඇතිවීම.

ආදී කාරණා පුරාණ මාගම නගරයට අදාලව ලැබුණු පබළු නියැදිය මගින් හඳුනා ගත හැකි වීම මාගම සංස්කෘතික ඉතිහාසය පෝෂණයට හේතු විය.

අනතුරුව එළඹෙන පරිණත නාගරික අවධිය වශයෙන් සලකන ක්‍රි. ව. 350ත් ක්‍රිස්තු වර්ෂ 600ත් අතර එනම් බුද්ධදාස රජුගේ(ක්‍රි.ව338-369) සිට පළවෙනි අග්බෝ රාජ්‍ය කාලය දක්වා (ක්‍රි.ව350-600) අනුරාධපුරය මුල් කරගෙන පාලකයින් රැසක් පාලනය කර තිබේ. මෙකල ගල්, මැටි හා වීදුරු යන අමුද්‍රව්‍ය තුනෙන් ම නිර්මිත පබළු හමුවීමත් ඒවා අතරින් ගල් භාවිතයෙන් සැඳුම්ලත් පබළු අනෙක් අමුද්‍රව්‍ය ද්විත්වයට ම වඩා වැඩි ය. නමුත් ඔවුන් අලංකාරත්වයට මුල්තැන දෙමින් මේවා නිර්මාණය කර තිබෙන බව පබළු නියැදිය පරීක්ෂාකරන විට හඳුනා ගත හැකි ය. එනම් ඔවුන්ගේ නාගරික ශෛලීය වටපිටාව තුළ ඔවුන් අත්පත් කරගෙන සිටි අවශ්‍යතාවන් ක්‍රමයෙන් ඉහත අවධීන්ට සාපේක්ෂව ඉහළ යාමත් සමඟ මේ අවධියේ අලංකාරත්වය සම්බන්ධව වැඩි අවධානයක් යොමුකර තිබෙන බව හඳුනා ගැනීමට හැකිවීම මෙම කාලයේ පුරාණ මාගම තමන්ගේ සංස්කෘතිය තුළ හඳුනාගත හැකි විශේෂ කාරණාවකි.

අනතුරුව එළඹෙන හයවන අවධිය වශයෙන් සැලකෙන ක්‍රි. ව. 600 -1000 අතර පළවෙනි අග්බෝ රාජ්‍ය කාලයේ සිට පස්වන මිහිඳු රාජ්‍ය කාලය දක්වා වූ මෙම වකවානුව තුළ සමස්ත පබළු නිධියෙන් පබළු 26 ක් ලැබී ඇත. අනුරාධපුරයේ මේ කාලය පුරා පවතින්නේ වරින්වර ඇති වූ දේශපාලනික අස්ථාවරතාවයන් ය. දේශපාලනික වශයෙන් ඇති වූ දුර්වලතා පුරාණ මාගම නගරයට යම්තාක් දුරට බලපාන ලද බවට වීදුරු සහ මැටි මාධ්‍ය කොට ගත් පබළු පමණක් හමු වීමෙන් හඳුනාගත හැකි ය. එනම් නගරයක් වශයෙන් සංවර්ධනයට පත් වූ මෙම නගරයට ද අනුරාධපුර ප්‍රධාන රාජධානියේ ඇති වූ දේශපාලන ව්‍යාකූලතාවයන් වක්‍රාකාරව බලපාන්නට ඇති බව හඳුනා ගත හැක. මුල් හා පරිණත නාගරික අවධිවල දී ආනයනික අමුද්‍රව්‍යවලින් නිර්මිත පබළුවල සාධක හමු

වුව ද මෙකල එකී අමුද්‍රව්‍යවලින් නිර්මිත පබළු හමු නොවීමෙන් පැහැදිලි වන්නේ එවැනි අමුද්‍රව්‍ය ආනයනය කරලීමට තරම් සුදුසු දේශපාලන වාතාවරණයක් නොපැවති බව ය. ඒ අනුව අනුරාධපුර රාජධානිය චෝල ආක්‍රමණ හේතු කොට ගෙන බිඳ වැටීමට පෙර ඇති වූ දේශපාලනික ව්‍යාකූලතාවයන් පුරාණ මාගම නගරයට ද බලපාන ලද බවත් එම තත්ත්වයන් පබළු මඟින් හෙළිදරව් කර ගත හැකි බව පැහැදිලි ය.

අනතුරුව ප්‍රවිශ්ට වන්නේ හත්වන අවධිය වශයෙන් සැලකෙන කි. ව. 1000-1400 දක්වා පුරාණ මාගම නගරයේ නාගරිකත්වය පිරිහීම සනිටුහන් වන කාල පරිච්ඡේදයට ය. අනුරාධපුර රාජධානිය මේ වන විට බිඳ වැටීමට ලක් වී තිබුණු අතර ඒ සමඟ ඇති වූ ව්‍යාකූලතාවයන් පුරාණ මාගම නගරයට ද බලපාන ලද අතර එම කරුණු පුරාණ මාගම නගරය පිරිහීම දක්වා ගමනාන්තය වේගවත් කරලීමට හේතු විය. මෙම වකවානුව තුළ ගල්, මැටි, දත්, ඇටකටු හා වීදුරු යන අමුද්‍රව්‍ය ගණනාවකින් ම නිර්මාණය කරන ලද පබළු හමු වූ අතර විශේෂයෙන් ම පොළොන්නරුව රාජධානිය පිරිහීමට පත් වීමත් සමඟ පාලකයින්ගේ අනුග්‍රහය නොලැබී යාමත් හා මාගම නගරය සමඟ ප්‍රධාන රාජ්‍ය මධ්‍යස්ථානය පවත්වන්නට යෙදුණ සම්බන්ධතා දුර්වල වීම ත් සමඟ ක්‍රමයෙන් පිරිහී ඇති බව පබළු නියැදිය තුළින් මනාව පැහැදිලි වේ.

ඒ අනුව සමස්තයක් වශයෙන් ගත්කල පුරාණ මාගම නගරයේ සංස්කෘතිය සම්බන්ධව ප්‍රධාන සංස්කෘතික අවධීන් හතට අදාළව ලැබුණු සාධක අනුව සංස්කෘතික ඉතිහාසය පෝෂණයට අනාවරණය කරගත හැකි වූ සංස්කෘතික ලක්ෂණ කැටි කොට ගතහොත් පබළු අභිචාර විධියක් ලෙස යොදා ගැනීම, ඉන්දීය සංස්කෘතික ආභාසය ලැබීම සහ නොලැබී යාම, විදේශීය සම්බන්ධතා, අමුද්‍රව්‍ය භාවිතය සුවිශේෂීතා, තාක්ෂණික ශිල්පීය කුසලතාවය, සෞන්දර්යාත්මක හැකියාව, දේශපාලනික ස්ථාවරත්වය හා ව්‍යාකූලතා හා නාගරිකත්වය පිරිහීම යන කාරණාවන් හඳුනාගත හැකි ය.

ඒ අනුව ගත් විට ලංකා ඉතිහාසයේ ක්‍රි. පූ 900 සිට ක්‍රි.ව 1400 දක්වා දීර්ඝ කාලයක් තුළ පුරාණ මාගම නගරයේ සංස්කෘතිකත්වය

අධ්‍යනයේ දී අනාවරණය නොවූ කාරණා රැසක් ම පබළු මඟින් හෙළිදරව් කර ගත හැකි වූ බව ඉහත කරුණු අනුව නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමරවංස හිමි. (1994) *මහාවංසය*, කැළණිය: පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

කන්නන්ගර, පත්මසිරි සහ විද්‍යාලංකාර, අනුත්තාරාදේවි. (2016) *ඉපැරණි ලෝක ශිෂ්ටාචාර*, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

කෘෂ්ණසිංහ, නරේන්ද්‍ර. (1958) *ඉන්දීය ඉතිහාසය*, කොළඹ : ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රකාශනයකි.

තාපර්, රොමිලා. (1973) *ඉන්දියාවේ ඉතිහාසය*, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රකාශනයකි.

පාකර්, හෙන්රි. (1884) *තිස්සමහාරාම පුරාවිද්‍යාව*, පොල්ගස්ඕවිට: ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රාලය.

සුමනසාර, කරගම්පිටිගොඩ. (1968) *හෙළදිව රාජ වංශය 2 විමර්ශී*, කොළඹ 10: රත්න පොත් ප්‍රකාශකයෝ.

සෝමදේව, රාජ්. (2017) *ශ්‍රී ලංකාවේ ආදි ඉතිහාසය*, මහරගම: නියමුවා ප්‍රකාශන.

සෝරත හිමි. (1959) *බුත්සරණ*, කෝට්ටේ: විද්‍යෝදය පිරිවෙන.

සෝරත හිමි. (2004) *ථූපවංසය*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

Bandaranayake, Senaka.(1994) *Further Studies In The Settlement Archaeology Of Sigiriya - Dambulla Region - A Brief Report Of The Excavation Ibnkakuwa A Proto & Early Historic Site*, Colombo 7: Post Graduate Institute Of Archaeology.

Beck, Horace, C .(1928) *Classification & Nomenclature Of Beads & Pandents* ,London: Johon Johnson For The Society Of Antiquaries

Bednarik, Robert, G .(2015) *The Significance Of The Earlist Beads*, Author & Scientific Reserch Publishing Inc. Dubin, Lois.Sherr .(1987)The History of Beads, London:Thomes & Hudson ltd.

Somadeva, Raj .(2006) *Urban Origins In Southern Sri Lanka*, Sweden: African and Comparative Archaeology Department of Archaeology and Ancient History Uppsala University.

Weisshaar, H.J, Roth,H & Wijeypala, W.(2001) *Ancient Ruhuna*, Mainz:

Verlag PhilipVon Zabern.

## සඟරා

අඹන්වල, සී.බී.(2010). "අනුරාධපුර ජේතවන ක්ෂේත්‍රයෙන් වාර්තා වී ඇති පබළු නිර්මාණය හා ඒ ඇසුරෙන් කෙරෙන මූලික වර්ගීකරණය" Archaeology & Heritage Studies. තුන්වන කලාපය. රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යාව සහ උරුම අධ්‍යයනඅංශයඃ මිහින්තලය.

Begley, V., J.R. Lukas, and K.A.R. Kennedy. (1981)Excavations of Iron Age Burials at Pomparippu 1970. Ancient Ceylon 4. 51-132. Colombo: Department of Archaeology.

Carswell, J., and Prickett, M. 1984. Mantai: (1980): A preliminary investigation. Ancient Ceylon No. 5. Journal of the Archaeological survey of Sri Lanka. Colombo: Department of Archaeology.